

# ඔබගේ අයිතිවාසිකම් හා යුතුකම්

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

# ඔබගේ අයිතිවාසිකම්

## 1.

## තොරතුරු දැනගැනීම






රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් අපහැදිලි හෝ තේරුම් ගැනීමට අපහසු ඕනෑම කරුණක් පිළිබඳව, රක්ෂණ සමාගමෙන් අවශ්‍ය පැහැදිලි කරගැනීම් ලබාගැනීමට ඔබට අයිතියක් ඇත.

රක්ෂණ ඔප්පුවට අදාල වැදගත් කරුණු සියල්ල පිළිබඳව රක්ෂණ සමාගම විසින් ඔබව දැනුවත් කළ යුතුය.

ඔබ රක්ෂණ හිමිකම්පෑමක් කළ විටදී එහි වත්මන් තත්වය මෙන්ම හිමිකම් ප්‍රතික්ෂේප වීමකදී ඒ සඳහා පදනම් වූ හේතු ද ඇතුළුව, ඔප්පුවට අදාල සියළු කාරණා සම්බන්ධයෙන් පැහැදිලිව ඔබ වෙත දැනුම් දීම රක්ෂණ සමාගමේ වගකීමකි.

2.

## ගෙවන මුදලට සරිලන රක්ෂණාවරණයක් ලබාගැනීම

ඔබගේ අවශ්‍යතාවලට හොඳින් ගැලපෙන රක්ෂණාවරණයක් ලබාගැනීමට ඔබට අයිතියක් ඇත.

රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ හෝ එහි සඳහන් කොන්දේසි සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, රක්ෂණ ඔප්පුවේ සඳහන් නිශ්චිත කාලසීමාව තුළදී එය අවලංගු කිරීමට ඔබට අයිතියක් ඇත.

ඔබ ලබාගැනීමට අදහස් කරන රක්ෂණ ඔප්පුව පිළිබඳ අවබෝධ කර ගැනීම සඳහා, රක්ෂණ යෝජනා පත්‍රය භාරදීමට පෙර ආදර්ශ රක්ෂණ ඔප්පුවක් තමන් කැමති භාෂාවකින් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි) ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත.

3.

## සද්භාවයෙන් යුතුව සැලකුම් ලැබීම

සෑම අවස්ථාවකදීම රක්ෂණ සමාගම වෙතින් උපරිම සද්භාවයෙන් යුතුව සැලකුම් ලැබීමට ඔබට අයිතියක් ඇත.

රක්ෂණ ඔප්පුව ආශ්‍රිත සියළු කටයුතු වලදී රක්ෂණ සමාගම විසින් සත්‍ය, සාධාරණ හා විනිවිදභාවයකින් යුක්තව ක්‍රියා කළ යුතුය.

# 4.

## පැමිණිලි නිරාකරණය කර ගැනීම




ඔබේ රක්ෂණ ඔප්පුවට අදාල ඕනෑම කරුණක් සම්බන්ධයෙන්; එනම් රක්ෂණ හිමිකමක් සම්බන්ධයෙන් සමාගම කටයුතු කළ ආකාරය පිළිබඳව සෑහීමකට පත් නොවීම, ගෙවන ලද වන්දි ප්‍රමාණවත් නොවීම වැනි කරුණු සම්බන්ධයෙන් රක්ෂණ සමාගම වෙත පැමිණිලි කිරීමට ඔබට අයිතියක් ඇත.

ඔබගේ පැමිණිල්ල සම්බන්ධයෙන් සාධාරණව, කාර්යක්ෂමව සහ අප්‍රමාදව කටයුතු කිරීමට රක්ෂණ සමාගමට වගකීමක් ඇත.

# ඔබේ යුතුකම්

5.

## සද්භාවයෙන් යුතුව කටයුතු කිරීම




රක්ෂණ ඔප්පුව ලබාගැනීමට පෙර මෙන්ම ඉන් පසුවත් උපරිම විශ්වාසය රැකෙන පරිදි කටයුතු කිරීමට ඔබට යුතුකමක් ඇත.

රක්ෂණ යෝජනා පත්‍රය පිරවීමේදී ඔබ අවංක විය යුතු අතර එමගින් සත්‍ය හා නිවැරදි තොරතුරු ඔබගේ රක්ෂණ සමාගම වෙත ලබා දිය යුතුය. සත්‍ය හා නිවැරදි තොරතුරු ලබා දීමට ඔබ අපොහොසත් වුවහොත් (උදාහරණයක් ලෙස ජීවිත රක්ෂණයක් ලබා ගැනීමේදී ඔබේ සෞඛ්‍ය තත්වය සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු නොදීම), එය ඔබේ හිමිකම් ප්‍රතික්ෂේප වීමට පමණක් නොව රක්ෂණ ඔප්පුව අවලංගු වී ඒ සඳහා ගෙවූ සියළු මුදල් අහිමි වීමටද හේතු විය හැක.

රක්ෂණ ඔප්පුව යටතේ හිමිකමක් ඉල්ලුම් කිරීමේදී ද ඔබ අවංක විය යුතු අතර සත්‍ය හා නිවැරදි තොරතුරු සැපයිය යුතුය.

6.

# රක්ෂණ ඔප්පුව පවත්වා ගෙනයාම




රක්ෂණ වාරික ගෙවීමේදී, රක්ෂණ සමාගමෙන් දැනුම් දීමක් ලැබෙන තෙක් නොසිට අදාල දිනට හෝ සහන කාලසීමාව තුළදී රක්ෂණ වාරික ගෙවීමත්, එසේ ගෙවූ බවට තහවුරුවක් ලබා ගැනීමත් ඔබේ යුතුකමකි.

ඔබේ ලිපිනයේ හා දුරකථන අංකයේ යම් වෙනසක් සිදුවුහොත් ඒ පිළිබඳව නොපමාව රක්ෂණ සමාගම වෙත දැනුම්දීම ඔබේ යුතුකමකි. එමගින් රක්ෂණ සමාගම වෙතින් නිකුත් කෙරෙන වැදගත් නිවේදන සියල්ල නොකඩවා ලබාගැනීමට හැකි වේ.

රක්ෂණ ඔප්පුව ඔබ අතට ලැබුණු විගස කියවා බලා එය ඔබ බලාපොරොත්තු වූ රක්ෂණාවරණය ද යන්න (ආවරණය කර ඇති උපද්‍රව, ප්‍රතිලාභ, ගෙවිය යුතු වාරිකය, ඔප්පු කාලසීමාව හා ඔප්පුවේ කොන්දේසි යනාදිය) තහවුරු කරගැනීම ඔබේ යුතුකමකි. ඔබ ලබාගත් රක්ෂණ ඔප්පුව පිළිබඳව ගැටළු තිබේ නම් නොපමාව රක්ෂණ සමාගම අමතා අවශ්‍ය පැහැදිලි කිරීම් ලබාගත යුතුය.

7.

## හිමිකම් ඉල්ලීමකදී සහයෝගය දැක්වීම

රක්ෂණ සමාගමකින් වන්දි/හිමිකම් ඉල්ලීමේදී, අදාල රක්ෂණාවරණයේ කොන්දේසි අනුව, නිශ්චිත කාලසීමාවක් තුළදී රක්ෂණ සමාගමට දැනුම් දීමටත්, ඒ පිළිබඳව අවශ්‍ය ලියකියවිලි හා වෙනත් අදාල තොරතුරු ලබාදීමටත් ඔබට යුතුකමක් ඇත.

වන්දි ඉල්ලීමක් සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කිරීම සඳහා රක්ෂණ සමාගමට ඔබේ සහයෝගය අත්‍යවශ්‍ය වේ.

වන්දි/හිමිකම් නිරාකරණය කිරීමට සහයෝගය දැක්වීම සඳහා, නිශ්චිත කාලසීමාව තුළ දී හිමිකම සම්බන්ධයෙන් රක්ෂණ සමාගමට දැනුම් දීමට සහ ඒ සඳහා අත්‍යවශ්‍ය ලියකියවිලි හා අදාල තොරතුරු ලබාදීමට ඔබ අපොහොසත් වුවහොත්, ඔබේ රක්ෂණ හිමිකම ගෙවීම ප්‍රමාදවීම හෝ ප්‍රතික්ෂේප වීම සිදු විය හැක.

8.

## මතක තබාගන්න

ඔබේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්වීමෙන් හා ඔබේ යුතුකම් ඉටු කිරීමෙන්, ඔබේ රක්ෂණාවරණයෙන් බලාපොරොත්තු වූ ප්‍රතිලාභ ලබාගත හැකි වනු ඇත.

# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි යොමු කරන ආකාරය



9.

## රක්ෂණ හිමිකමක් පිළිබඳව පැමිණිල්ලක් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ බලතල ප්‍රකාරව රක්ෂණ ඔප්පුහිමියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා රක්ෂණ හිමිකම් සම්බන්ධ පැමිණිලි විභාග කිරීම සිදු කරන අතර ඒ සඳහා අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ:

පළමුව ඔබගේ රක්ෂණ සමාගම වෙත පැමිණිල්ල යොමුකරන්න. රක්ෂණ සමාගමට පැමිණිල්ල යොමු කරන ආකාරය ගැන දැනගැනීම සඳහා https://ircsl.gov.lk/list-of-insurance-companies/ වෙත පිවිසෙන්න. සමාගම සාධාරණ කාලසීමාවක් ඇතුළත එය නිරාකරණය කර ඒ සඳහා ඔබට පිළිතුරක් ලබා දිය යුතුය.

ඔබට රක්ෂණ සමාගමෙන් සාධාරණ කාලසීමාවක් තුල පිළිතුරක් නොලැබුනහොත් හෝ පැමිණිල්ල නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබ සෑහීමකටපත් නොවන්නේ නම්, ඔබගේ පැමිණිල්ල ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව හෝ රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කල හැකිය.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා https://ircsl.gov.lk/policyholder-complaints/ වෙත පිවිසෙන්න.

මෙහි දක්වා ඇති කිසිදු තොරතුරක් රක්ෂණ ඔප්පුවක නියමයන් සහ කොන්දේසි ප්‍රතිස්ථාපනය හෝ ප්‍රතික්ෂේප නොකරයි. රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු සඳහා හෝ වෙනත් අමතර තොරතුරු සඳහා රක්ෂණ සමාගම, රක්ෂණ තැරැව්කාර සමාගම හෝ රක්ෂණ නියෝජිතයා අමතා ලබා ගත හැක.

INSURANCE
REGULATORY
COMMISSION
OF SRI LANKA

**වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශය**
**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
11 වන මහළ, නැගෙනහිර කුළුන,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.
දුරකථනය - 0112 2396184-9 I ෆැක්ස් - 0112 2396190
විද්‍යුත් තැපෑල - mder@ircsl.gov.lk

www.ircsl.gov.lk

https://www.facebook.com/Ircslofficialpage/

https://www.linkedin.com/company/insurance-regulatory-commission-of-sri-lanka/

https://www.youtube.com/channel/UCuM9RLGQTi7B2MM7PL7jfiA

බැඳියාව හා නොපිළිගැනීම
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් මහජනතාවගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙම අත්පොත මුද්‍රණය කරන ලද අතර, කිසිදු නීති උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් මෙය උපයෝගී කරගත නොහැක.